# බුද්ධ ධර්මය

## 07 ශ්‍රේණිය



# 04.දිවි සරසන සිරිත විරිත

- චාරිත්‍ර යනු  අප විසින් පුරුදු කළයුතු හොඳ දේවල්ය. ඒවා සිරිත් ලෙස ද හඳුන්වයි.
- වාරිත්‍ර යනු අප විසින් නොකළ යුතු දේවල්ය.ඒවා විරිත් ලෙස ද හඳුන්වයි
- සිරිත් විරිත් පිළිබඳ මෑත කාලයේ ලියැවුණු පොතකි සිරිත් මල්දම.




- මෙහි කර්තෘ ඇම්.ඇල් ද සිල්වා ගුරු මුහන්දිරම් මහතාය.

- සිරිත් මල්දම පොතෙහි එන කවියක් හඳුනා ගනිමු.

ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ
වැඩි කොට ඇඳුමුත් ඇඳ නොම ගන්නේ
ගමනට ගෙදරට එක නාඳින්නේ
වයසට පමණට ඇඳුම් ඇඳින්නේ

- සිරිත් විරිත් පිළිබඳ පැහැදිලි කරන තවත් පොතකි කාව්‍යශේඛරය.
- එහි කර්තෘ තොටගමුවේ ශ්‍රී රාහුල හිමිය.



# නිවසේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත්

- නිවසට ඇතුළු වීමේදී පැළැඳ සිටින පාවහන් ගැලවීම.
- කැලි කසල ආදී අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීම.
- තම සිරුර ආවරණය වන පරිදි සුදුසු ඇඳුම් ඇඳීම.
- උදේ සවස තෙරුවන් වැඳීම.
- වැසිකිළි කැසිකිළි වලට ඇතුළු වීමට පෙර උගුර පාදා ශබ්දයක් කිරීම.



# පාසලේදී අනුගමනය කළ යුතු සිරිත් විරිත්

- පිරිසිදු නිල ඇඳුමෙන් සැරසී සිටීම.
- කෙස් නියපොතු කපා පිළිවෙලකට  කොණ්ඩය පීරා තිබීම.
- ගුරුවරුන් දුටු විට හුනස්නෙන් නැගිට ආචාර කිරීම.
- ගුරුවරුන් හා සහෝදර සිසුන් සමඟ සුහදශීලිව කටයුතු කිරීම.
- පාසල තුළ විනයගරුකව හැසිරීම.



# පන්සලේදී අනුගමනය කළ යුතු සිරිත් විරිත්

- සුදුසු චාම් ඇදුමකින්(ළමා සාරිය, ජාතික ඇඳුම)සැරසී පන්සලට යාම.
- හිස් වැසුම් පාවහන් ගලවා ඇතුළු වීම.
- සෑ මළුව බෝ මළුව විහාර මළුව පිරිසිදු කොට කැලි කසල නිසි පරිදි බැහැර කිරීම.
- පූජා හා වන්දනා අවසානයේ භාවිත කළ බඳුන් සෝදා පිරිසිදු කොට තැබීම.
- මහ සඟරුවනට ආරාධනා කිරීමේදී දැහැත් වට්ටියක් සුදු වස්ත්‍රයකින් වසා පිළිගැන්වීම.

